# හිත හොඳ නුලාරා



සෙනුජි ඔකිත්මා රත්නායක

# හිත හොඳ නුලාරා

*ලියන්නේ* - සෙනුජි ඔකිත්මා රත්නායක

*අඳින්නේ* - සෙනුජි ඔකිත්මා රත්නායක

*©කතෘ ප්‍රකාශනයකි.*

2023 නොවැම්බර් මස 15 දින

**ISBN 978-624-206-885-5**

# පිදුම

කුඩා කල සිට හොඳ නරක

කියාදුන්

මාගේ දෙමාපියන්ටත්,

මාගේ පාසලේ මා හට ගුරුහරුකම්

කියාදෙන චාමිනි ගුරුතුමියටත්

හද පිරි බැතියෙන්

මාගේ මෙම කුළුදුල් පොත

පිලිගනන්වමි!



# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිතසමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන විද්‍යුත්පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ග්‍රන්ථකතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත්පොතක් ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු !

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලයගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශශිකලා සේනාධීර (විදුහල් පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 11 15

දුප්පත් පවුලක නුලාරා කියලා අහිංසක ගැහැණු ළමයෙක් සිටියා.



ඇයට ඉන්නේ අම්මයි අත්තම්මයි විතරයි.



නුලාරාට අම්මා හැමදාම කියලා දෙන්නේ "අපි හැමෝටම උදවු කරමින් සහයෝගයෙන් වැඩ කරන්න ඕනෑ" කියලා.



ඒ වගේම නුලාරාත් තමන්ට පුලුවන් හැම වෙලාවෙම යාළුවන්ටත් ගමේ හැමෝටමත් උදවු කරනවා.



දවසක් පාසලෙන් විනෝද චාරිකාවක් ගියා.




ඒ යන අතරමගදී නුලාරාට හොදටම අසනීප වුණා.

නුලාරාගේ අහිංසකකමත් හිත හොඳ කමත් නිසාම ඒ වෙලාවේ ගුරුවරු හා යාළුවන් සියලු දෙනාම ඇයට උදව් කළා.



පසුව නුලාරාව රෝහලකට ගෙනගොස් ප්‍රතිකාර ලබා දුන්නා. ඇය ඉක්මනින්ම සුවය ලැබුවා.

ඇය පාසලේ ඉතා දක්ෂ ළමයෙක් නිසා, ගුරුවරු සහ ළමයින් සියලු දෙනා එකතුවෙලා ඇයට ගොඩක් තෑගි දීලා උදවු කලා.



ලැබුන තෑගි වලින් ඇයට ඇයගේ ගොඩක් අඩුපාඩු පිරිමසා ගන්න පුළුවන් වුණා.



තවත් ඉතුරු තෑගි ඇයට වඩා දුප්පත් ළමයින්ට බෙදලා දුන්නා.



"මේ හැම දෙයක්ම ඔයාට ලැබුනේ ඔයාගේ තිබුන අහිංසකම නිසා හා හිත හොඳකම නිසා" කියලා එයාගේ අම්මා එයාට කියලා දුන්නා.

අත්තම්මාත් ඉතා සතුටින් නුලාරාගේ හිස පිරිමැද්දා. ඒ විදිහට නුලාරා හැමදාම සතුටින් ජීවත් වුණා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා මැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු !


මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023 . 11 . 15



ISBN 978-624-206-885-5
Bar Code – 9786242 068855

******************************

# නිමි

*****